# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2019 අංක 20 දරන ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2019 ඔක්තෝබර් මස 31 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2019 නොවැම්බර් මස 01 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකි ය.

**මිල :** රු. 12.00 **තැපැල් ගාස්තුව :** රු. 15.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## 2019 අංක 20 දරන
## ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2019 ඔක්තෝබර් මස 31 වන දින]

එල්.ඩී.—ඕ. 9/2019

**2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.

**1.** මේ පනත 2019 අංක 20 දරන ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, මේ යටතේ වෙනස් වූ බලාත්මක වීමේ දින නිශ්චිතව සඳහන් කරනු ලබන්නේ නම් මිස, 2019 නොවැම්බර් මස 1 වන දින සිට බලාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

2009 අංක 9 දරන පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

**2.** 2018 අංක 20 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනතේ 3 වන වගන්තිය, එහි (2) වන උපවගන්තියෙහි (iv) වන ඡේදයෙහි, (12) වන උපඡේදයේ "ආනයනකරු විසින් ම" යන වචන වෙනුවට "2019 නොවැම්බර් මස 1 වන දිනට පෙරාතුව, ආනයනකරු විසින් ම," යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය ප්‍රතිශෝධනය කිරීම.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:-

"දේශීය ආදායම් පනතේ ඇතැම් විධිවිධාන අදාළ විය යුතු බව.

8. (1) 2018 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව වූ යම් කාල පරිච්ඡේදයක් සඳහා 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ වාර්තා යනාදියට අදාළ XII වන පරිච්ඡේදයේ 106, 107, 108 සහ 112 වන වගන්තිවල විධිවිධාන ද, තක්සේරු කිරීමට අදාළ XXII වන පරිච්ඡේදයේ විධිවිධාන ද, අභියාචනවලට අදාළ XXIII වන පරිච්ඡේදයේ විධිවිධාන ද, තක්සේරු කිරීම්වල අවසානාත්මකභාවය සහ වැරදි වාර්තා සම්බන්ධයෙන් දණ්ඩනවලට අදාළ XXIV වන පරිච්ඡේදයේ විධිවිධාන ද, පැහැර හරිනු ලැබූ බද්ද සහ එයට එකතු කරනු ලබන මුදල්වලට අදාළ XXV වන පරිච්ඡේදයේ විධිවිධාන ද, බදු අයකර ගැනීමට අදාළ XXVI වන පරිච්ඡේදයේ විධිවිධාන ද, විවිධ කාරණාවලට අදාළ XXVII වන පරිච්ඡේදයේ විධිවිධාන ද, වැරදි හා දණ්ඩනවලට

අදාළ XXIX වන පරිච්ඡේදයේ විධිවිධාන ද, පරිපාලනයට අදාළ XXX වන පරිච්ඡේදයේ 209 වන වගන්තියේ විධිවිධාන සහ පොදු කාරණාවලට අදාළ XXXI වන පරිච්ඡේදයේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, මේ පනත යටතේ වාර්තා සැපයීම්, තක්සේරු කිරීම්, තක්සේරු කිරීම්වලට එරෙහි අභියාචන, තක්සේරුවල අවසානාත්මකභාවය, වැරදි සඳහා වූ දණ්ඩන, බදු ගෙවීම පැහැරහැරීම සහ ඊට එකතු කරන ලද මුදල්, බදු අයකර ගැනීම, විවිධ කාරණා, වැරදි සහ දණ්ඩන, පරිපාලනය සහ පොදු කාරණා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(2) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ පරිපාලන විධිවිධානවලට, වාර්තා තබා ගැනීම සහ තොරතුරු රැස්කිරීමට, බදු වාර්තාවලට, තක්සේරු කිරීම්වලට, විරෝධතා සහ අභියාචනාවලට, පොලියට, බදු අයකර ගැනීමට, දණ්ඩනවලට, අපරාධ නඩු කටයුතුවලට සහ නියෝගවලට අදාළ IX වන, X වන, XI වන, XII වන, XIII වන, XV වන, XVI වන, XVII වන, XVIII වන, සහ XIX වන පරිච්ඡේදවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, 2018 අප්‍රේල් මස 1 දින හෝ එදිනට පසු ආරම්භ වන යම් කාල පරිච්ඡේදයක් සඳහා, පිළිවෙළින්, පරිපාලනය, වාර්තා තබා ගැනීම සහ තොරතුරු රැස්කිරීම, බදු වාර්තා තබා ගැනීම, තක්සේරු කිරීම්, විරෝධතා සහ අභියාචනා, පොලිය, බදු අයකර ගැනීම, දණ්ඩන, අපරාධ නඩු කටයුතු සහ නියෝග සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) පහත දැක්වෙන වෙනස් කිරීම්වලට යටත්ව ඉහත සඳහන් (1) සහ (2) වන උපවගන්තිවල විධිවිධාන අදාළ විය යුතු ය:-

(අ) දේශීය ආදායම් පනතේ එවැනි යම් විධිවිධානයක තක්සේරු වර්ෂයක් සඳහා කරනු ලබන සෑම සඳහනක් ම මේ පනතේ ''අදාළ කාර්තුවට'' කරන ලද සඳහනක් ලෙස සලකනු ලැබිය යුතු ය;

(ආ) දේශීය ආදායම් පනතේ එවැනි යම් විධිවිධානයක තක්සේරු කළ හැකි ආදායමට හෝ බදු අය කළ හැකි ආදායමට කරනු ලබන සෑම සඳහනක් ම මේ පනතේ ''බද්දට යටත්

පිරිවැටුමට'' කරනු ලබන සඳහනක් ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඈ) දේශීය ආදායම් පනතේ එවැනි යම් විධිවිධානයක ආදයම් බද්දට කරනු ලබන සෑම සඳහනක් ම මේ පනතේ විධිවිධාන ප්‍රකාරව අයකරනු ලබන සහ පනවා ඇති බද්දට කරන ලද සඳහනක් ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඇ) මේ පනත යටතේ යම් කාර්තුවක් සඳහා වාර්තාව ඉදිරිපත් කිරීමේ දිනය එකී අදාළ කාර්තුව අවසන් වීමෙන් ඉක්බිතිව ම ආරම්භ වන මාසයේ විසිවන දිනය හෝ ඊට පෙර දිනයක් හෝ විය යුතු ය;

(ඉ) (i) තක්සේරු වර්ෂයේ අදාළ කාර්තුව සඳහා මේ උපවගන්තියේ (ඈ) ඡේදයේ සඳහන් දිනයේ දී හෝ එදිනට පෙර වාර්තාවක් ඉදිරිපත් කොට ඇති යම් තැනැත්තකු, අදාළ කාර්තුව යෙදෙන තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම වූ තක්සේරු වර්ෂයේ නොවැම්බර් මස තිස්වන දින සිට, එකී කාල පරිච්ඡේදය 2018 අප්‍රේල් මස 1 වන දිනට පෙර යම් කාල පරිච්ඡේදයක් සඳහා වන විට මාස දහඅටක් ඉකුත් වූ පසුව සහ එකී කාල පරිච්ඡේදය 2018 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් කාලපරිච්ඡේදයක් සඳහා වන විට, මාස තිහක් ඉකුත් වූ පසුව ඉදිරිපත් කොට ඇත්නම් ඒ තැනැත්තා සම්බන්ධයෙන්; හෝ

(ii) මේ උපවගන්තියේ (ඈ) ඡේදයේ සඳහන් දිනයේ දී හෝ එදිනට පෙර වාර්තාවක් ඉදිරිපත් කිරීම පැහැර හැර ඇති යම් තැනැත්තකු සම්බන්ධයෙන් අදාළ කාර්තුව යෙදෙන තක්සේරු වර්ෂයකට ඉක්බිතිව ම වූ තක්සේරු වර්ෂයේ නොවැම්බර් මස තිස්වන දින සිට අවුරුදු හතරක් ඉකුත් වූ පසුව,

මේ පනත යටතේ තක්සේරුවක් හෝ අතිරේක තක්සේරුවක් කරනු නොලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.

**4.** 2015 අංක 12 දරන පනත මගින් අවසන්වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියේ "දේශීය ආදායම් පනත" යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:-

" "දේශීය ආදායම් පනත" යන්නෙන් -

(i) 2018 අප්‍රේල් මස 1 වන දිනට පෙර යම් කාලපරිච්ඡේදයක් සඳහා, 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත; සහ

(ii) 2018 අප්‍රේල් මස 1 වන දින සහ ඉන්පසුව එළඹෙන යම් කාලපරිච්ඡේදයක් සඳහා, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත,

අදහස්වේ;".

ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම.

**5.** 2018 අංක 20 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය පහත දැක්වෙන පරිදි තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එම උපලේඛනයේ I වන කොටසේ-

(අ) (XLIX) අයිතමයේ "රේගු කාර්ය සඳහා" යන වචන වෙනුවට, "2019 නොවැම්බර් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් කාලපරිච්ඡේදයක් වෙනුවෙන් රේගු කාර්ය සඳහා" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ආ) (LIV) අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්:-

"(LIV) ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය වෙත ලියාපදිංචි වූ තැනැත්තකු විසින් කපා, ඔපදමා ප්‍රතිඅපනයනය කිරීමේ කාර්යය සඳහා මැණික් ගල් ආනයනය කිරීම සහ එම ආනයනය

සඳහා කරනු ලබන ගෙවීම් විදේශ ව්‍යවහාර මුදලින් සිදුකර බැංකුවක් හරහා ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කිරීම;";

(ඈ) (LV) අයිතමයේ "ද්‍රව්‍ය ආනයනය කිරීම" වෙනුවට "ද්‍රව්‍ය ආනයනය කිරීම;" යන වචන ආදේශ කිරීමෙන්;

(ඈ) (LV) අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අයිතම එකතු කිරීමෙන්:-

"(LVI) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ බදු අය කරනු ලැබූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්දට යටත්ව ආනයනය කරන ලද ශුද්ධ නොකළ පාම් තෙල්වලින් හෝ ආනයනය කරන ලද පාම් ඔලෙයින්වලින් දේශීයව නිපදවනු ලබන පාම් තෙල්;

(LVII) ලූසන් (ඇල්ෆැල්ෆා) ආහාර සහ ගුළි ආනයනය කිරීම;

(LVIII) රේගු කාර්ය සඳහා නිශ්චිතව සඳහන් කරන ලද ශීර්ෂ අංක 8903.91.00 යටතේ වර්ගීකරණය කරන ලද පරිදි විනෝදය සඳහා හෝ ක්‍රීඩා සඳහා වූ යොට් යාත්‍රා සහ වෙනත් යාත්‍රා, කුඩා හබල් ඔරු සහ කැන්වස් ආනයනය කිරීම; සහ

(LIX) 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ගිවිසුමකට ඇතුළත් වූ ඇමරිකානු ඩොලර් මිලියන පනහකට නොඅඩු ප්‍රාග්ධන ආයෝජනයන් සහිත වූ යම් ව්‍යවසායයක් විසින්, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන කාලසීමාව තුළ සහ වාණිජ කටයුතු ආරම්භ කිරීම පෙර, එකී ව්‍යවසායයෙහි යම් ව්‍යාපෘතියක් සඳහා, ව්‍යාපෘතියට අදාළ වූ යම් භාණ්ඩයක් ආනයනය කිරීම.".

(2) එම උපලේඛනයේ II වන කොටසේ-

(අ) (vii) වන අයිතමයේ-

(i) (ඇ) ඡේදයේ "ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවකු හෝ උප කොන්ත්‍රාත්කරුවකු සලසන සේවා" යන වචන වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන්:-

"ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවකු හෝ උප කොන්ත්‍රාත්කරුවකු සලසන ලද සේවා; හෝ ";

(ii) (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන්:-

"(ඈ) 2019 නොවැම්බර් මස 1 වන දින හෝ එදිනට පසු ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවකු හෝ උප කොන්ත්‍රාත්කරුවකු සලසනු ලබන සේවා;"; සහ

(ආ) (xii) අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්:-

"(xii) යම් හෝටලයක්, අමුත්තන්ගේ නිවාසයක්, ආපන ශාලාවක් හෝ ඒ හා සමාන වෙනත් ව්‍යාපාරයක් ලංකා සංචාරක මණ්ඩලය වෙත ලියාපදිංචි කර ඇත්නම් එම හෝටලය, අමුත්තන්ගේ නිවාසය, ආපනශාලාව හෝ වෙනත් සමාන ව්‍යාපාරය විසින්-

(අ) 2011 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව ලබා දෙන ලද සේවා; හෝ

(ආ) ශ්‍රී ලංකාවේ බැංකුවක් හරහා විදේශීය ව්‍යවහාර මුදලින් තත් සේවා සඳහා ගෙවීම් කරන අවස්ථාවක දී

2019 නොවැම්බර් මස 1 වන දින හෝ
එදිනට පසු ලබා දෙනු ලබන සේවා;".

**6.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.